# රෝසිගේ සපත්තුව



තයිෂි දනුල්‍යා හැන්නැදිගේ

| | |
|---|---|
| කෘතියේ නම | රෝසිගේ සපත්තුව |
| කතෘගේ නම | තයිෂි දනුල්යා හැන්නැදිගේ |
| කතෘගේ වෙනත් කෘති | ඉබිහාමි<br>දගයා |
| කෘතිය පළ කරන දිනය | 2025-02-08 |
| ප්‍රථම මුද්‍රණය | 2025 |
| ලිපිනය | 137, ලේවැල්ල පාර, මහනුවර. |
| ISBN අංකය | 978-624-208-235-6 |
| මුද්‍රණය | චම්පා ස්ටෝර්ස්, දළදා වීදිය, මහනුවර. |

# පිදුම

ආදරණීය තාත්තාට, අම්මාට, අයියාට

සිප්සතර කියාදුන් මාගේ මුල්ම ගුරුවරිය වූ

දමයන්ති ගුරුමෑණියන්ට,

ප්‍රාථමික අංශයේ විදුහල්පතිනියට

සහ

කියවීමට කැමති සියළු දෙනාට

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණි"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

ලස්සන අහිංසක ළමයෙක් හිටියා. එයාගේ නම රෝසි. එයාට හිටියේ අම්මා විතරයි. අම්මත් එක්ක රෝසි හැමදාම දර අහුලන්න කැළයට යනවා.



එක දවසක් දර අරගෙන
එනකොට හයියෙන් වහින්න
ගත්තා.



අනේ අම්මේ දර ටික තෙමුණානේ කියලා රෝසි  කියන කොටම රෝසිට තිබුණ එකම සෙරෙප්පුව කැඩුණා



එයා හොඳටම අඬන්න ගත්තා. අම්මාටත් දුකයි. ඒත් සෙරෙප්පු දෙකක් ගන්න විදිහක් රෝසිගේ අම්මාට තිබුණේ නෑ.



තවත් දවසක රෝසියි අම්මායි කැළයට  යනකොට දර අහුලන්න හරිම පුදුම දෙයක් දැක්කා



අම්මේ මේ බලන්නකෝ  ලස්සනම
ලස්සන සපත්තු දෙකක් රෝසි
ඒක දැකලා පුදුම වුණා



මේ සපත්තු දෙක අපි
ගන්න හොඳ නෑ
අපිට අයිති නැති දෙයක් කියලා
යන්න ගියා



සුරංගනාවියක් ඇවිත්
රෝසි මේ සපත්තු දෙක
මම ඔයාට තෑගි දෙන්න
ගෙනාවේ කියලා අතට දුන්නා.



රෝසිට හරිම සතුටුයි.
සුරංගනාවි කිව්වා මේ සපත්තු
දෙක දැකලත් ගත්තේ නැති
නිසා ඔයා ගොඩාක් හොඳ
ළමයෙක් කියලා.



රෝසි කිව්වා අපිට අයිති නැති
දෙයක් ගන්න හොඳ නැති නිසායි
මම ඒක ගත්තේ නැත්තේ කියලා

රෝසි ඒ සපත්තු දෙක දාගෙන
හරිම සතුටින් ගෙදර ආවා.





## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්